## ශ්‍රී ලංකා මහ බැංකුව

----------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝක්හි දේපලක් අත්කරගෙන, අනාගතයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ අවශ්‍යතාවය පරිදි එම ගොඩනැගිල්ල පාවිච්චියට ගන්නා තුරු පවතින වෙළඳපල රේටය අනුව එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිතායතනය සඳහා කුලියට දී තිබුණි. 2011 අගෝස්තු 30 දින එහි අයිතිය පවරා තිබුණද ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට එහි ගැණුම් පිරිවැය ප්‍රාග්ධනිත කරනු වෙනුවට කෙරීගෙන යන ඉදිකිරීම් ගිණුම යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සෝමාවතී ජාතික වනෝද්‍යානයේ ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. වර්ෂය අවසානය වන විට එහි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර තිබුණද එම දේපල සඳහා නිවැරදි ගිණුම්කරණ පරිචය යොදාගැනීම වෙනුවට කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ගිණුමේ දක්වා තිබුණි.

(ඇ) 2009 දෙසැම්බර් 22 දින ශ්‍රී ලංකා මහ බැංකුව "නැෂනල් මියුචුවල් ඇෂුවරන්ස්"ගොඩනැගිල්ල රු.මිලියන 175 කට අත්කරගෙන තිබුණි. එය දේපල පිරියත හා උපකරණ හෝ ආයෝජන දේපල යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරමක් ලෙස දක්වා තිබුණි.

(ඈ) ඉංජිනේරු තොග විෂයයන් 1,811 ක් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය විෂයයන් 35 ක් අගය නොකර, 2011 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල තොග ශේෂයට ගෙන තිබුණු බව විගණනයේදී

හෙළිදරව් වූ අතර එම නිසා ශේෂ පත්‍රයේ දක්වා තිබුණු නොග ශේෂයේ නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්වීමට නොහැකි විය.

1.2.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වියපැහැදම් නොකරන ලද කාර්ය මණ්ඩල පාරිශ්‍රමික ශේෂ එකතුව වන රු. 688,117 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ආදායමට බැර කිරීමට හෝ ශේෂ නිරවුල් කිරීමට පියවර නොගෙන වර්ෂ තුනකට වැඩි කාලයක් එලෙසම පැවතුණි.

(ආ) නැවත ගෙවිය යුතු ටෙන්ඩර් ගාස්තු ශේෂය වන රු.2,147,547 ක් වර්ෂ 5 කට වැඩි කාලයක් පාලන ගිණුමක තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් එම ශේෂය සඳහා සැපයුම්කරුවන් විසින් හිමිකම්පෑමක් කර නොතිබුණු අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එය ආදායමට මාරු කිරීමට හෝ සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

**මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය වූ රු.මිලියන 11,744 සමඟ සසඳා බලන විට රු.මිලියන 46,830 ක ශුද්ධ ලාභයක් විය. ඉකුත් වර්ෂයේ ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන පාඩුව වූ රු.මිලියන 8,659 ට එරෙහිව සමාලෝචිත වර්ෂයේ ලාභය රු.මිලියන 3,577 ක් වීම හා ඉකුත් වර්ෂයේ දේශීය මුදල් මූල්‍ය වත්කම් මත ශුද්ධ පාඩුව වූ රු.මිලියන 4,219 හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ආදායම රු.මිලියන 226 ක් වීමද සමාලෝචිත වර්ෂයේ ලාභය වැඩිවීමට හේතු වී තිබුණි.

**ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ස්ථායිකරණය පිළිබඳ කටයුතු**

2.2.1 **අවසර නොලත් මූල්‍ය ව්‍යාපාර වලට එරෙහිව ගනු ලැබූ පියවර**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවසරයකින් තොරව ව්‍යාපාර කරන පුද්ගලයින්ට එරෙහිව පහත කටයුතු කිරීමට 1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනතේ 37 වගන්තිය යටතේ මුදල් මණ්ඩලය වෙත බලය පවරා තිබුණි. සමාගමක් වශයෙන් හෝ ව්‍යවස්ථාපිත පුද්ගලයකු වශයෙන්, එම සමාගමේ හෝ ව්‍යවස්ථාපිත ආයතනයේ නම සහ අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ පුද්ගලයකු වන විටදී හෝ

ව්‍යවස්ථාපිත නොවන පුද්ගලයකු වන විටදී එම පුද්ගලයාගේ හෝ ව්‍යවස්ථාපිත ආයතනයේ සාමාජිකයකුගේ නම අවසර නොලත් මූල්‍ය ව්‍යාපාරයක් ලෙස ප්‍රකාශ කළ හැක. ඒ අනුව මුදල් මණ්ඩලය විසින් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය විසින් හඳුනාගත් අවසර නොලත් මූල්‍ය ව්‍යාපාර පවත්වාගෙන ගිය සමාගමකට එරෙහිව පහත ක්‍රියාමාර්ග ගන්නා ලෙස 2011 පෙබරවාරි 21 දින උපදෙස් දී තිබුණි.

(i) තවදුරටත් කිසිදු තැන්පතු භාර නොගැනීමට /නව ණය ලබානොදීම හෝ වහාම ක්‍රියාත්මක වන පරිදි ඕනෑම ආයෝජනයක් නොකිරීම

(ii) මාස 18 ක් ඇතුලත තැන්පතු බැරකම් ආපසු ගෙවීමට සහ මාසයක් ඇතුලත මාසික තැන්පතු ආපසු ගෙවීමේ සැලැස්මක් සමග තහවුරු කිරීම් ඉදිරිපත් කිරීම

(iii) තැන්පතු නිරවුල් කිරීම සම්බන්ධයෙන් ස්වාධීන විගණකවරයකුගේ තහවුරුවක් ඉදිරිපත් කිරීම

(iv) බාහිර විගණකවරුන් මාරු කිරීම සහ යෝජිත විගණන සමාගම් තුනෙන් එකක් පත්කිරීම

(v) උපදෙස් දුන් දිනට තැන්පතු බැරකම් වටිනාකම ඔවුන්ගේ මුළු තැන්පතු බැරකම් වටිනාකමට ආවරණය කිරීම

(vi) සමාගමට සහ කණ්ඩායමේ සම්බන්ධිත පාර්ශවයන්ට තවදුරටත් පහසුකම් නොසැපයීමට සහ ,

(vii) උපදෙස් දුන් දින සිට මාස 3 ක් ඇතුලත සමාගමට සහ කණ්ඩායමේ සම්බන්ධිත පාර්ශවයන්ට දැනටමත් ලබාදී තිබු පහසුකම් සම්පුර්ණයෙන්ම ආපසු අයකරගැනීමට

තවද මූල්‍ය සමාගම් පනතේ නියමයන් උල්ලංඝනය කරමින් මූල්‍ය ව්‍යාපාරවල යෙදී සිටින ආයතනයක් වශයෙන් සමාගමේ නම සහ ලියාපදිංචි ලිපිනය පුවත්පත්වල පලකිරීමට සහ සමාගමට එරෙහිව නීතිමය කටයුතු ආරම්භ කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් උපදෙස් දෙන ලදී. එහෙත් විගණන දිනය දක්වාද එම සමාගම මුදල් මණ්ඩලය නිකුත් කළ උපදෙස් වලට අනුකුල වීමෙන් තොරව කටයුතු කළද බැංකු නොවන මූල්‍ය ආයතන අධ්‍යක්ෂ විසින් තවදුරටත් ඒ ගැන ක්‍රියාත්මක වී නොතිබූ බව විගණනයේදී හෙළිදරව් විය. එසේ වුවත් සමාගම, මුදල් මණ්ඩලය ලබාදුන් යෝජනා ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා තවමත් අධීක්ෂණ ක්‍රියාවලි තත්ත්වයේ සිටින බවත් එය

සතුටුදායක බවත් එම නිසා නම ප්‍රකාශ කිරීම සහ මෙම අවස්ථාවේදී නීතිමය කටයුතු ආරම්භ කිරීම අවශ්‍ය නොවන බවත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පැහැදිලි කරන ලදී.

## 2.2.2 අසාර්ථක මූල්‍ය සමාගම් අධීක්ෂණය

ගෙවීම පැහැරහරින ලද මූල්‍ය සමාගම් 13 ක් සඳහා 1988-1994 කාලපරිච්ඡේදය ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සෘජු ණය සහ ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාදී තිබුණ අතර ඉන් සමාගම් 2 ක් පුනරුත්ථාපනය වී සහ සමාගම් 6 ක් දැනටමත් අවසන් කර සහ ඉතිරි සමාගම් 5 ඈවර කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. 2011 පෙබරවාරි 28 දිනට මුළු හිඟ ශේෂය , ප්‍රාග්ධනය රු. 1,936,494,749 කින් සහ පොලිය රු. 4,217,766,345 කින් සමන්විත වේ. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුළු හිඟ ශේෂය වන රු. 6,154,261,095 ක මුදල ශ්‍රී ලංකා මහ බැංකු ගිණුම්වලින් කපා හැරීමට මුදල් මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී තිබුණු අතර මුදල් මණ්ඩලයේ අදහස වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඈවර කිරීමේ ක්‍රියාවලිය යටතේ එම හිඟ ශේෂයන් අයකරගැනීමට සියළු ප්‍රයත්න දැරීමත් , මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ ඉදිරිපත් කිරීම උදෙසා එම ශේෂයන් ලියාහැරීම විචක්ෂණ බවයි. තවද ඈවරකරුවන් වෙත ඉදිරිපත් කළ හිමිකම්පෑම් වලංගුව පැවතීම සහ ඈවරකරුවන් වෙතින් හිඟ අයකරගැනීම සඳහා සියළු ප්‍රයත්න දැරීමට 2011 මාර්තු 21 දින මුදල් මණ්ඩලය විසින් තීරණය කර තිබුණි.

එසේ වුවත් ඉහත තීරණයට පසුව ,ඈවරකරුවන් විසින් බෙදාහරින තුරු අක්‍රියව පවත්නා අසාර්ථක මූල්‍ය සමාගම් 6 කින් ඈවරකිරීමේ ක්‍රියාවලිය තුලින් හිමිකම් පෑමට 2011 සැප්තැම්බර් 01 දින මුදල් මණ්ඩලය තීරණය කර තිබුණි. ඉහත තීරණ ගැන සලකන විට මුදල් මණ්ඩලය විසින් මාස 6 ක කාලයක් තුල එකිනෙකට පරස්පර තීරණ 2 ක් ගෙන ඇති බවත් පෙර තීරණය වෙනස්කිරීමේ විචක්ෂණ භාවය විගණනයට ප්‍රශ්නගත බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.3 ප්‍රාදේශීය සංවර්ධන කටයුතු

සහභාගිත්ව ණයදෙන ආයතන (PCIs) හරහා විවිධ ප්‍රාදේශීය සංවර්ධන අංශ සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව (RDD) විසින් චක්‍රීය අරමුදල් සහ ණය යෝජනා ක්‍රම 20 ක් පවත්වාගෙන යනු ලබයි. 2011 වර්ෂය තුල ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව (RDD) විසින් චක්‍රීය අරමුදල් සහ ණය යෝජනා ක්‍රම 20 ක් පවත්වාගෙන යනු ලැබුවත්, අධීක්ෂණ කාර්යයන් උදෙසා අවසන් භාවිතාකරන්නන්ගේ ව්‍යපැහැදම් ඉලක්කයන් පෘථුල වර්ගීකරණයන් 2 කට ස්ථාපිත කරීම

වෙනුවට එක් එක් චක්‍රීය අරමුදල් සඳහා පැහැදිලි අරමුදල් වියපැහැදම් ඉලක්කයන් හඳුනාගෙන නොතිබූ අතර එසේ අරමුදල්වල මෙහෙයුම් මත පාලනයේ අඩුපාඩු දක්නට ලැබූ බවත් නිරීක්ෂණය විය.

## 2.4 <u>මානව සම්පත් කළමනාකරණය</u>

හදිසි තදබල අසනීප, විශාල ශල්‍යකර්ම හා දිගුකාලීන රෝග තත්ත්වයන් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයින්ට හා විශ්‍රාමිකයින්ට ප්‍රතිකාර සඳහා අවශ්‍ය මූල්‍යාධාර ප්‍රදානය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකු ආපදා සහන අරමුදල (EPDRF) පිහිටුවා තිබුණි. 2011 වර්ෂය අවසානය වන විට අරමුදලේ සාමාජිකත්වය දැනට සේවයේ යෙදී සිටින සේවකයින් 844 දෙනෙකුගෙන් හා විශ්‍රාමිකයින් 874 කින් සමන්විත වූ අතර අරමුදලේ මුළු දායකත්වය රු. මිලියන 36.3 ක් විය. මුදල් මණ්ඩල තීරණය ප්‍රකාර අරමුදල රු.මිලියන 100 ක වටිනාකමට ළඟා වන තුරු භාවිතා නොකළ යුතු වූ බැවින් එම අවස්ථාව වන තෙක් අරමුදලේ මූලික අරමුණු ඉටුකරගත නොහැකි වූ බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පැහැදිලි කරන ලදී . එම නිසා ශ්‍රී ලංකා මහ බැංකුව එහි සාමාජිකයන්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා නියාමන වෙනස්කම් සලකා බැලීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(i) අරමුදල එහි ආරම්භයේ සිටම අදහස් කළ අරමුණු සඳහා භාවිතා කරන වෙනුවට රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර තිබුණි.

(ii) ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාපිත විදේශ ආධාර ව්‍යාපෘතියකට , ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු මුදාහැරීමට 2010 පෙබරවාරි 15 දින මුදල් මණ්ඩලය විසින් තීරණයක් ගෙන තිබුණි. ණය ගිවිසුමේ බී කොටසේ 7 ඡේදය ප්‍රකාර ණයගැණුම්කරු (ශ්‍රී ලංකා රජය) විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්විතීයන කාර්ය මණ්ඩල පිරිවැය ආවරණය කරගැනීමට ප්‍රතපාර්ශවීය අරමුදල් සැපයිය යුතුය. එසේ වුවත් 2011 වර්ෂය වෙනුවෙන් දරන ලද රු. 1,938,870 ක පිරිවැය වටිනාකම මෙම වාර්තාවේ දිනය වන විටත් ප්‍රතිපාර්ශවීය අරමුදලින් අයකරගෙන නොතිබුණි.

## 2.5 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2010 වර්ෂයේදී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සෝමාවතී ජාතික වනෝද්‍යානය තුළ සංචාරක බංගලාවක් ඉදිකර තිබුණ අතර ඉදිකිරීම් වැඩ සඳහා රු මිලියන 59.8 ක් වැයකර තිබුණි. වන ජීවී සංරක්ෂණ පනතේ විධිවිධාන අනුව ගොඩනැගිල්ලේ නීතිමය හිමිකම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරා නොතිබුණි. ඒ වෙනුවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමග වර්ෂ 30 ක් සඳහා ඉඩම භාවිතා කිරීමට අවබෝධතා ගිවිසුමකට එළඹී තිබුණි. එසේ වුවත් ශ්‍රී ලංකා මහ බැංකුවේ පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින්

පවත්වනු ලබන වාර්තා අනුව සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 13 කදී පමණක් නවාතැන් ගැනීම් සඳහා සංචාරක බංගලාව භාවිතා කර තිබුණු අතර නවාතැන් ගාස්තු වශයෙන් රු.71,500 ක් පමණක් උපයා තිබුණි.

## 2.6 <u>මතභේදයට තුඩුදුන් කරුණු</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රටෙහි ආර්ථික අවපාතයක් පැතිරී පවතින සහ මිල නියම නියෝජිතායතන විසින් මිල නියමයන් පහත හෙළන තත්ත්වයකදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2011 අප්‍රේල් 05 දින මුහුණත අගය යුරෝ 30,000,000 ක් සහ වෙළඳපල අගය යුරෝ 22,163,500 ක ග්‍රීක රජයේ බැඳුම්කරවල ආයෝජනය කර තිබුණි. පසුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2011 ජූලි 18 දින සහ 2011 නොවැම්බර් 23 දින පිළිවෙලින් යුරෝ මිලියන 5 ක සහ යුරෝ මිලියන 10 ක බැඳුම්කර විකුණා තිබු අතර ඉන් යුරෝ 4,911,000 ක අලාභයක් දැරීමට සිදු වී තිබුණි. ඉතිරි යුරෝ මිලියන 15 ක ශේෂය සම්බන්ධයෙන් 2012 මාර්තු 12 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පතිව්‍යුහගත වැඩසටහනකට එළඹී තිබුණි. එසේ වුවත් ශ්‍රී ලංකා මහ බැංකුව 2012 සැප්තැම්බර් 12 දක්වා ප්‍රතිව්‍යුහගත උපකරණ සියල්ල විකුණා තිබුණු අතර සමස්ත ගනුදෙනුවෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 15.6 ක පාඩුවක් සිදු වී තිබුණි. එසේ වුවත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2011 වර්ෂයේදී එක්සත් ජනපද ඩොලර් මිලියන 430 ක මුළු ලාභයක් ඉපයීමට (ලකුණු කළ වෙළඳපල ප්‍රතිලාභය හැර ) හෝ සංචිත කළඹ මත 6.6 % ක ප්‍රතිලාභ අනුපාතයක් ලබාගැනීමට සැලසුම් කර තිබු බවද නිරීක්ෂණය විය.

(ආ) තෝරාගත් ජාත්‍යන්තර නගරවල කාර්යාල ගොඩනැගිලි මිලදී ගැනීමට 2011 ජනවාරි 10 දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව නිව්යෝර්ක්හි පිහිටි කාර්යාල පරිශ්‍රයක් මිලදී ගැනීමට එක්සත් ජනපද ඩොලර් 5,807,116 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලය වෙත ප්‍රේෂණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. අතුරු වැඩපිළිවෙලක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව එහි අනාගත මෙහෙයුම් සඳහා යොදාගැනීමේ අරමුණින් මෙවැනි ප්‍රසම්පාදනයක් සිදුකළද , මෙම දේපල එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිතායතනය වෙත කුලියට දී තිබු අතර එය මුදල් නීති පනතේ 117 වගන්තියේ දක්වා ඇති, " මහ බැංකුව වෙලදාම හෝ නැතහොත් ඕනෑම වාණිජ කාර්මික හෝ වෙනත් ව්‍යාපාරයක ඍජු අයිතියක් හැර එවැනි ලාභයක්, සැහීමකට පත්වන ආකාරයෙන් ඕනෑම හිමිකමක් පවරා ගැනීමෙහි නිරත නොවිය යුතුය " යන්න සමග එකිනෙකට පරස්පර විරෝධී වේ.

ii. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු කරගෙන යාම සඳහා එක්සත් ජනපද ඩොලර් 400,000 ක් එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිතායතනය වෙත යවා තිබුණි. එසේ වුවත් කොන්ත්‍රාත්කරු තෝරාගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන තොරතුරු , කොන්ත්‍රාත්කරුගේ ගෙවීම් සඳහා වන උපයෝගී ලිපිලේඛන වල මුල්පිටපත් ( වැඩ සහතික කිරීම් , කෙරෙමින් පවතින බිල්පත් ) විගණනය සඳහා ලබාගත නොහැකි විය.

iii. 2012 මැයි 28 දින විදේශ කටයුතු අමාත්‍යාංශය සමග කුලී ගිවිසුම අත්සන් කළද කුලී ගාස්තු ලැබී තිබුණේ 2012 ජුනි මාසය සඳහා පමණි. එසේ වුවත් ශ්‍රී ලංකා මහ බැංකුව විසන් විගණන දිනය වන විටත් කුලී නිවැසියා වෙතින් හිඟ කුලී අයකරගැනීමට කිසිදු ඵලදායී පියවරක් ගෙන නොතිබුණි.